PR/2020/S 12

# ජපන් තානාපති කාර්යාලය

From the People of Japan


නො.20 ශ්‍රීමත් ආර්.ජී.සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
දුරකථනය:94-11-269-3831~3, ෆැක්ස් : 94-11-269-8629
ඊ-මේල් : cultujpn@co.mofa.go.jp


**පුවත්පත් නිවේදනය**

2020 ජූලි මස 22 වන දින

**නිදහස් සහ සාධාරණ මහ මැතිවරණයක් සහතික කිරීම සඳහා ජපානයෙන් සහය**

ජපන් රජය, "බිම් මට්ටමේ මානව ආරක්ෂණය උදෙසා වන ආධාර ව්‍යාපාතිය" (ජීජීපී – GGP – Grant Assistance for Grassroots Human Security Project) හරහා ඇමරිකානු ඩොලර් 47,019 ක් (දළ වශයෙන් රුපියල් මිලියන 8.5 ක) ආධාර මුදලක්, එළඹෙන අගෝස්තු 5 වන දින පැවැත්වීමට නියමිත මහ මැතිවරණයේ නිරීක්ෂණ කටයුතු සඳහා සහ ඡන්ද හිමියන්ගේ ඡන්ද අයිතිය පිළිබඳ දැණුවත් කිරීමේ කටයුතු වෙනුවෙන් වූ "තිරසාර ප්‍රජාතාන්ත්‍රීකරණයක් තුළින් නිදහස් සහ සාධාරණ මැතිවරණයක් පැවැත්වීමේ ව්‍යාපාතිය" සඳහා ලබා දීමට තීරණය කර ඇත. මේ සඳහා වන ආධාර ගිවිසුම් සඳහා අත්සන් තැබීම කොළඹ පිහිටි ජපන් තානාපති කාර්යාලයේදී, 2020 ජූලි මස 22 වන දින වැඩබලන ජපන් තානාපති, කිටමුරා ටොෂිහිරෝ මැතිතුමා සහ නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය හෙවත් පැෆරල් (PAFFREL) සංවිධානයේ විධායක අධ්‍යක්ෂක රෝහන හෙට්ටිආරච්චි මහතා අතර සිදුකරන ලදී.

කෝවිඩ් -19 වැනි ගෝලීය වසංගත තත්වයක් යටතේ වුවද, ශ්‍රී ලංකාවේ ජනතාවට තමන්ගේ ඡන්ද අයිතිය නිදහස් හා සාධාරණව ප්‍රකාශ කිරීමට දිරිගැන්වීමක් මෙම ව්‍යාපාතිය හරහා ලබා දෙයි. කෝවිඩ් -19 මර්දනය සඳහා ශ්‍රී ලංකාව ගෙනයන වැඩපිළිවෙලට ඒකාබද්ධව කටයුතු කිරීමට සහ රට තුළ ප්‍රජාතාන්ත්‍රවාදය ඇතිකිරීමට දක්වන සහයෝගයක් වශයෙන් ජපානය දීර්ඝකාලීන මිතුරෙකු ලෙස, තම සහයෝගය පැෆරල් සංවිධානයට දක්වනු ලබයි.

ප්‍රමුඛපෙළේ දේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස, පැෆරල් සංවිධානය මැතිවරණය හා සම්බන්ධ ක්‍රියාකාරකම් අපක්ෂපාතීව සිදුකරනු ලැබේ. මේ යටතේ ජාතික වශයෙන් ඡන්ද ප්‍රකාශ කිරීමේ සහ ගණන් කිරීමේ මධ්‍යස්ථාන වල යෙදවීමට බලාපොරොත්තු වන මැතිවරණ නිරීක්ෂකයින් 460 දෙනෙකුට පුහුණුව ලබා දීම සිදුකරනු ලබයි. තවද රූපවාහිනිය, පුවත්පත් සහ ගුවන්විදුලිය වැනි ජනමාධ්‍ය ඔස්සේ ද ඡන්ද දායකයින් දැණුවත් කිරීම

සිදුකරනු ලබයි. ඡන්ද කටයුතු සඳහා ලබා දෙන මෙම සහයෝගය බිම් මට්ටමේ සිටින මහජනයා දක්වා සියලුම ජනතාවගේ දේශපාලන සහභාගීත්වය සහතික කිරීම වෙනුවෙන් යොදාගනු ඇතැයි ජපානය බලාපොරොත්තු වෙයි.

මෙම ආධාර ප්‍රදානය පිළිබඳ අදහස් දක්වමින් පැෆරල් සංවිධානය ප්‍රකාශ කර සිටියේ;

“ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මැතිවරණ නිරීක්ෂකයා ලෙස පැෆරල් සංවිධානය පසුගිය වසර 30ක කාලයක සිට අඛණ්ඩව සෑම මැතිවරණයකම නිරීක්ෂණ කටයුතු සිදුකර ඇති බවත්, පැෆරල් සංවිධානය විසින් 5000කට අධික මැතිවරණ නිරීක්ෂකයින් ප්‍රමාණයක් දිවයිනේ සියළුම සිවිල් සංවිධාන හා ක්‍රියාකරුවන් නියෝජනය වන පරිදි යොදා ගැනෙන බවත්, තවද මේ තුලින් ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිවිය හැකි අවස්ථා අවම කර ගැනීමටත්, ඒ මගින් නිදහස් සහ සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට හැකි පරිසරයක් සහතික කිරීමටත්, සියළුම ඡන්ද දායකයින්ට තම ඡන්දය නිදහස්ව ප්‍රකාශ කිරීමට ඇති අයිතිය සහතික කිරීමටත් බලාපොරොත්තු වන බවත්ය.

තවත් අතකින්, යහපාලනය සහ ප්‍රජාතාන්ත්‍රවාදය තහවුරු කිරීම සඳහා ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම සහ පිරිසිදු දේශපාලනයක් සඳහා පෙනී සිටින අය ආරක්ෂා කිරීමට පැෆරල් සංවිධානය අඛණ්ඩව ක්‍රියාකරනවා. මෙය අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, එය ඡන්ද දායකයින් දැණුවත් කිරීමේ වැඩසටහන් අතරතුර ද සිදුකරනවා.  කෝවිඩ් -19 පැතිරීම හේතුවෙන් කණ්ඩායම් සාකච්ඡා සහ රැස්වීම් යනාදිය වළක්වාලමින් සහ ලබා දී ඇති සංචරණ සීමා සහ භෞතික දුරස්ථභාවය පිළිබඳ පුරුදු සැලකිල්ලට ගනිමින් පැෆරල් සංවිධානය තම දැණුවත් කිරීමේ වැඩසටහන් නවමු උපායමාර්ග යටතේ සමාජ මාධ්‍ය, ගුවන් විදුලිය සහ රූපවාහිනිය යොදාගෙන සිදුකරනවා.

පැෆරල් සංවිධානය තම කාර්යභාරය සහ වගකීම ඵලදායී ලෙස පසුගිය වසර 30කට අධික කාලයක සිට සපුරාලමින් ජනතා විශ්වාසය දිනාගෙන තියනවා. මෙම කාර්යයන් සාර්ථකව සිදු කිරීමට, මහජනතාවගෙන් ලැබෙන දැවැන්ත සහයෝගය සහ පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන සහයෝගය මූලික වශයෙන්ම හේතු වී තියනවා. අපගේ කාර්යභාරය සිදුකිරීමට පසුගිය දශක දෙකක කාලයක සිට ජපන් රජය, දක්වන මෙම ත්‍යාගශීලී සහය, පැෆරල් සංවිධානය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබනවා.”

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න;
සංවර්ධන සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය
දුරකථනය 011-269-3831~3 (දිගු අංකය 243)
ඊ-මේල් : cultujpn@co.mofa.go.jp